# භාරත නර්තන සම්ප්‍රදාය

## ඓතිහාසික පසුබිම

- අතීතයේ මුළු භාරතය පුරාම පැතිර තිබූ භාරත නර්තන ඉන්දීය නර්තනයන් අතර පැරණිතම නර්තනය ලෙස බොහෝ දෙනාගේ පිළිගැනීමයි.
- භාරත නර්තන සම්ප්‍රදායේ ‘‘හරත‘‘ යන නාමය නිර්මාණය වීම කෙරෙහි විවිධ නිර්වචන ඉදිරිපත් වී ඇත.
    - භාව, රාග, තාල, යන පදයන්ගේ පළමු වර්ණය එක් වීමෙන් ‘‘හරත‘‘ යන නාමය නිර්මාණය වූ බව,
    - 

    - අනෙක් මතය වන්නේ හරත මුණිවරයාගේ නාට්‍ය ශාස්ත්‍රෙයහි එන ඉගැන්වීම් ඒ අයුරින්ම අනුගමනය කරන හෙයින් හරත නම් වූ බවයි.

- මෙසේ නිර්මාණය වූ හරත නර්තන සම්ප්රදාය ඉංදියාවේ තමිල්නාඩු ප්‍රාන්තය කේන්ද්‍රය කොට ගනිමින් ව්‍යාප්ත වී ඇත.
- මෙම නර්තන සම්ප්‍රදාය මුළුමනින්ම ආගමික පදනමක් මත ගොඩනැගුණු නර්තන සම්ප්‍රදායකි.දේවාලයන්හි දෙවියන් ඉදිරියේ දේවදාසීන් නම් කන්‍යාවියන් විසින් රඟ දක්වන ලද මෙම නර්තනය ‘‘දාසි ආට්ටම්‘‘ යනුවෙන්ද අතීතයේ හඳුන්වා ඇත.
- දේව දාසීන් විසින් දෙවියන් උදෙසා පවත්වන ලද මෙම නර්තන ක්‍රමය සමාජ උත්සව සඳහා යොදා ගැනීමත් සමඟ කිසියම් පරිහානියකට පත්විය.
- මෙසේ අවුල්සහගත වූ හරත නර්තන කලාව අද පවත්වනු ලබන අනුපිළිවෙලට සකස් කිරීමට පුරෝගාමී වූයේ කන්ජාවූර් සහෝදරයින් සිව්දෙනාය. (ක්‍රි.ව. 1798-1824).
    - චින්නයියා
    - පොන්නයියා
    - වඩිවේලු
    - ශිවනාදන්
- මෙම කන්ජාවූර් සහෝදරයින් සිව් දෙනාද තන්ජෝර් දිස්ත්‍රික්කයේ ‘‘පන්ද නල්ලූර්‘‘ නම් වූ දාසි ආට්ටම් සඳහා ප්‍රචලිත වූ ගුරු කුලයකින් පැවත එන්නෝ වූහ.
- දාසි ආට්ටම් හෙවත් මෙම දාසි නර්තනය පාරම්පරිකව පවත්වාගෙන ගිය කාන්තාවන්ට ඉගැන්වීම් කරන ලද ගුරුවරුන් හඳුන්වන ලද්දේ නටුවනාර් යන නමිනි.
- මෙසේ පුහුණුව ලබා දේවාලයන්හිනර්තනයේ යෙදුන නළඟනන් කුලහීනයන් ලෙස බ්‍රාහ්මණ සමාජය හඳුන්වන ලදී.

- මෙකී නර්තනය කෙරෙහි ප්‍රභූ අවධානය යොමුවීමට පටන් ගැනුණේ ඇනා පැව්ලෝවා වැනි ජාත්‍යන්තර වශයෙන් ප්‍රකට නිළියන් විසින් භරත නර්තනය ඉගෙනීම ඇරඹුමත් සමගය.
- රුක්මණී දේවි, අරුන්ඩේල් වැනි උසස් බ්‍රාහ්මණ පවුල්වල කුල කාන්තාවන් නර්තනයට ප්‍රවිෂ්ට වීම ද නර්තනය කෙරෙහි ප්‍රභූ අවධානය යොමු වීමට හේතු සාධකයක් විය.
    - මේනකා, කුමරි කමලා, මිර්නාලිනී, වැනි උසස් පවුල්වල ප්‍රභූ කාන්තාවන් මෙකී නර්තනය ප්‍රගුණ කිරීමෙන් භරත නර්තනය ජාත්‍යන්තර තලයෙහි පවා කීර්තිමත් විය.
- භරත නර්තනය පොදු සමාජය අතර පිළිගත් නර්තන සම්ප්‍රදායක් බවට පත් කරන්නට උරදුන් අය අතර
    - ක්‍රිෂ්ණ අයියර්
    - රබීනන්ද්‍රනාත් තාගෝර්තුමාද වැදගත් තැනක් ගනී.

## භාරත නර්තනයෙහි රංග ආකෘතිය

- මෙය වඩාත් ප්‍රකට වන්නේ ස්ත්‍රී නර්තනයක් ලෙසයි.
- ඇතැම් අවස්ථාවල සාමූහිකව නර්තනය ඉදිරිපත් කළද ඒකලව ඉදිරිපත් කරනු ලබන නර්තන විශේෂයක් ලෙස හැඳින්වීම වඩාත් උචිතය.
- මෙසේ නර්තනය තනිව ඉදිරිපත් කිරීම නිසා එහි අන්තර්ගත කතා පුවත් ගෙනහැර දැක්වීමේදී එකම නිළියක විසින් චරිත කීපයක් එකවර ඉදිරිපත් කිරීමට වීම විශේෂ ලක්ෂණයකි.

## නර්තන අනුපිළිවෙල

1. **අලාරිප්පු**- භරත නර්තනය ආරම්භ වන්නේ අලාරිප්පු නර්තනයෙනි.නෘත්ය කොටසට අයත් කෙටි නර්තනයකි.

2. **ජෙතීශ්වරම්** - භරත නර්තනයේ දෙවන නර්තන අංගයයි.රිද්මයානුකූල ලක්ෂණයකින් යුක්ත මෙම නර්තනය ජෙති යනුවෙන් හැඳින්වෙන මාත්‍රා විශේෂයක් පදනම් කොට ගෙන ඉදිරිපත් කරයි.

3. **ශබ්දම්** - මෙය ස්තෝත්‍ර ගායනයක් අනුව කරනු ලබන සරල වශයෙන් අභිනය ප්‍රකාශ කරනු ලබන නර්තනයකි. මෙහි ශ්ලෝක ආගමික භක්තිය දනවන , ඇතැම්විට ශෘංගාරත්මක ලක්ෂණ අන්තර්ගත වූවකි.

4. **වර්ණම්** - තීරුමානම් නැමැති කොටසින් ආරම්භ කරන වර්ණම් ඉතා දීර්ඝ වූත් , සංකීර්ණ වූත් නර්තන අංගයකි. මෙය භාරත නාට්‍යම්හි අසීරුතම නර්තන අංගය

වන අතර නෘත්ත, හා නෘත්‍ය යන කොටස් දෙකෙහි සංකලනයකි. ශිව, පාර්වතී, ක්‍රිෂ්ණ , රාම, සීතා වැනි දේව චරිත හා බැදි සිද්ධිවලට අදාළව ඉතා සියුම් භාව ප්‍රකාශනයන්ගෙන් යුක්ත මෙය භරත නර්තන ශිල්පිනියකගේ විශේෂ දක්ෂතා ප්‍රදර්ශනය කරන අවස්ථාවකි.

5. **<u>පදම්</u>** - දෙවන භාගය ආරම්භ වන්නේ මෙම නර්තනයෙනි. ජාවලී, කීර්තනම් , ආදී වශයෙන් පදම් ගණනාවක් ඇත. පදම් නර්තනයේදී සාත්වික අභිනය හා මුද්‍රා භාවිතය යොදා ගනිමින් ගීතයන්ට අරුත් ප්‍රකාශ කරයි.

6. **<u>තිල්ලානා</u>** - හුදු රිද්මය ප්‍රකාශ කරන නර්තන අංගයකි. වේගවත් වූත්, අත්‍යාලංකාර වූත්, නර්තනයක් වන තිල්ලානාහිදී, අභිනයට එතරම් ස්ථානයක් හිමි නොවේ.

7. **<u>ශ්ලෝකම්</u>** - භරත නාට්‍ය සංදර්ශනයක අවසාන භාගයයි. ශ්ලෝක ගායනයට අනුව සාත්වික අභිනයට හා හස්ත මුද්‍රාවන්ට විශේෂ තැනක් දෙමින් කරනු ලබන නර්තන අංගයකි.

❖ <u>සංගීතය</u> - දකුණු ඉන්දියානු කර්ණාටක සංගීතය .
මෙහි සංගීත ශිල්පීන් මුත්තුකරාව් ලෙස හඳුන්වයි.

❖ <u>ප්‍රධාන වාද්‍ය භාණ්ඩය</u>- මෘදංගය
තාලම්පට, වීණාව, වයලීනය, තාම්පුරාව, බටනළාව

❖ <u>අංග රචනය</u> - කාන්තාවකගේ මුහුණට අලංකාරය දෙන සාමාන්‍ය අංග රචනයක් කරනු ලබයි.

❖ <u>රංග වස්ත්‍රාභරණ</u> - කාන්තා හා පිරිමි පාර්ශවයට රංග වස්ත්‍රාභරණ ආකාර 2කි.
ස්ත්‍රී- ස්ත්‍රීන් සඳහා භාවිතා කරන ඇඳුම් කට්ටල ආකාර 03කින් යුක්තය.

The National e-learning Portal for General Education








1. සාරි උඩෙයි - තද වර්ණයකින් යුත් යාර 6ක් දිග සාරියක් මෙහිදී යොදා ගනී.රතු, තැඹිලි ,කොළ , නිල් වැනි මූලික වර්ණ තෝරා ගැනීම සුවිශේෂත්වයකි. සාරිය ඇඳීමේදී දණහිසට පහළින් , වළලුකරට තරමක් උඩින් සිටින සේ අඳිනු ලබයි.

2. පිජාමා උඩෙයි - මෙම ඇඳුම් කට්ටලය මූලික කොටස් 4කින් යුක්තය. ඉණෙන් පහල කොටසට දෝතියක් අඳිනු ලබන අතර හැට්ටය මතුපිටින් සාරි පොටක හැඩය සේ දිස්වන ආකාරයේ සළු පොටක් පළඳී.(දාවනී)
   යටිකය පිජාමාවට උඩින් ඉණේ සිට දෙපතුල දක්වා රැළි කරන ලද රෙදි පොට පහළට වැටේ. මෙය යටිකුරු හැඩයට සැකසූ අවානක ආකාරයෙන් දිස්වන අර්ධ කවාකාර තට්ටු කිහිපයකින් යුත් රැළි මාලාවකි.

3. පාවාඩ දාවනී උඩෙයි- පිජාමාව ඇඳ ඊට උඩින් අඳිනු ලබන දෙපතුල දක්වා දිග රැළිතබා සකස් කළ රැළි සායකි. හැට්ටය ඇඳ ඊට උඩින් සාරි පොට යොදයි.

❖ ආභරණ





1. හිසට
    - උච්ච පට්ටම්- තැල්ල
    - නෙත්ති පට්ටම් - හිස මුදුනේ සිට පහතට වැටෙන තැල්ල
    - රක්වඩි- ශීර්ෂ පළඳනාවකි
2. කණට
    - තෝඩු- කරාබු
    - ජිමික්කි- කරාබුවෙන් පහලට එල්ලා වැටෙන පළඳනාව
    - මාට්ටල්- කරාබුවෙන් පහලට එල්ලා වැටෙන ලෙස අමුණා යොදනු ලබන  ආභරණයකි.
3. නාසයට
    - මුකුත්ති- රවුම් හැඩැති නාස් පුඩුවෙහි පළඳින ආභරණයකි.
    - නත්තුපිල්ලාක්කු- නාස් පුඩු දෙක මැදින් උඩු තොල මැදට වනසේ පළඳින ආභරණයකි.
    - මුක්කු මාට්ටල්- නාස් පුඩුවේ සිට කම්මුල හරහා ගොස් කණ අසලින් කොණ්ඩයට සම්බන්ධ වන සිහින් දම්වැලක් වැනි ආභරණයකි.
4. ගෙලට
    - අට්ටියල්- කුඩා කර තැල්ලකි.
    - මුත්තු මාලෙයි- බෙල්ලේ සිට දෙපියයුරු තෙක් දික් වූ පළල් මුතු මාලයකි. පදක්කම් මාලෙයි ලෙසද හඳුන්වයි.
    - කාසි මාලෙයි- කරට පළඳිනු ලබන කාසි වලින් සකස් කරන ලද මාලයකි.
5. ඉන
    - ඔට්ටියානම්- ඉනට පළඳිනු ලබන පටියක් මෙන් සාදන ලද ලෝහමය ආභරණයකි.
6. දෑතට
    - වංගි- දෑතේ බාහු වලට පළඳී
    - වලෙයියල්- මැණික්කටුවට පළඳී.
    - මෝදිරම්- දෑතේ ඇඟිලිවලට පළඳින මුදු විශේෂයකි.
7. පයට
    - සලංගෙයි- පාදයට පළඳින ගෙජ්ජි
    - කොලුසු- පාදයට පළඳින පාද ජාලා
    - මිංජි- පාදයේ දෙවන ඇඟිල්ලට පළඳින මුදුවකි.

## නළු ආභරණ

❖ පුරුෂ රංග වස්ත්‍රාභරණ අතිශයින්ම සරලය. ඉණෙන් පහළට දෝතියක් අඳිනු ලබන අතර බොහෝවිට උඩුකය නිරාවරණව හෝ බැනියමක් අඳියි.

- ඔට්ටියානම්- ඉනට බඳින පටිය
- කරමාල
- සලංගෙයි
- තෝඩු, වංගි
- උරබාහු
- හස්තකඩ



The National e-learning Portal for The General Education